## සාරාංශය

ළමා පරපුර ජාතියක් සතු වටිනා සම්පතකි. අනාගතයේ රටක් භාර වන්නේ ඔවුන්ටය. මේ නිසා ඔවුන්ගේ සහජ ශක්තීන් හඳුනාගෙන, ඒවා ඔප් නංවා නුවණැය පෑදීමත්, ඔවුන් ආදරයෙන් රැක බලා ගැනීමත් අප සතු වගකීමක් මෙන්ම යුතුකමක් ද වේ. මවුවරු විදේශ ගතවීම හේතුවෙන් නිවෙස් වල තනිවන දරුවන් හට ආදරය, රැකවරණය හා සෙනෙහස නොලැබීමත්, අවශ්‍යතා ඉටු නොවීමත්, අධ්‍යාපන කටයුතු අඩාල වීමත් අද සුලබව දැකිය හැකි සිද්ධීන්ය. මෙවැනි යුගයක ඒ පිළිබඳ අධ්‍යයනයක් කර ඔවුන් වෙනුවෙන් ඉටු කළ යුතු යුග මෙහෙවරක් පිළිබඳ අවධානය යොමු කරවීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

1 වෙනි පරිච්ඡේදයෙන් මවුවරුන් විදේශ ගතවීම හා සම්බන්ධව මතුවිය හැකි ගැටළු හා විදෙස් ගතවීමට හේතුවිය හැකි කරුණු පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. ඒ හා සම්බන්ධ සමාජ, ආර්ථික හා මනෝ විද්‍යාත්මක පසුබිම හා ඒ සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයක් 2 වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත. මව විදේශ ගතවූ දරුවන්ගේ අවශ්‍යතා නිසියාකාරව ඉටුකර ගැනීමට නොහැකිව ඉච්ඡාභංගත්වයට මෙන්ම විවිධ වූ මානසික ගැටළු වලට මැදිවන දරුවන් පිළිබඳ තොරතුරු එයින් ඉදිරිපත් කර ඇත. අවසානයේදි දත්ත රැස් කර ගැනීම සඳහා යොදාගත් උපකරණ පිළිබඳ විග්‍රහයක් 3 වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත. අධ්‍යයනයේ අරමුණු ඉටු කරගැනීමේ පදනම මත සකස් කර ගත් ප්‍රශ්නාවලියක් එහි ඉදිරිපත් කර ඇත. සම්මුඛ සාකච්ඡා මගින්ද දත්ත රැස් කර ගන්නා ලද අතර, ඒ සඳහා සකස්

කර ගත් නියමාවලියක් යොදා ගන්නා ලදි. තවද නියැදිය තෝරා ගත් ආකාරයද, එහි සීමාවන්ද මෙම පරිච්ඡේදයට ඇතුලත් කර ඇත.

හතර වෙනි පරිච්ඡේදයෙන්, පර්යේෂණයේදී ලබා ගත් දත්ත ඉදිරිපත් කර, ඒවා විශ්ලේෂණයේ ප්‍රතිඵල, ප්‍රතිශත භාවිතයෙන් ඉදිරිපත් කර ඇත.

පස්වැනි පරිච්ඡේදයේදී සමීක්ෂණයෙන් ලත් ප්‍රතිඵල සමාලෝචනයට භාජනය කරමින්, එළඹෙන ලද නිගමනත්, මේ සඳහා අනාගතයේ ගත හැකි පියවර පිළිබඳ යෝජනාත් ඉදිරිපත් කර ඇත.